## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහය - 2018

---

### 1.1 තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව
- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව
- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------

| | අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා එහි පරිපාලිත සමාගම් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතද අනුගමනය කර තිබුණද සමාගම් විසින් අනුගමනය කරන ලද පදනම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම හෙළිදරව්කර නොතිබුණි. | පරිපාලිත සමාගම් විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතිය අනුගමනය කිරීමේ පදනම 2019 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය මගින් හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | සමාගම් විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රමිත හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම හෙළිදරව් කළයුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගමේ සහ මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය පිළිවෙලින් රු.3,058,326 ක් හා රු.20,713,263 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වසර සඳහා ඵලදායි ජිවිත කාලය සමාලෝචනය කර එම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනනය කර ගිණුම් වලට ගැලපිමට කටයුතු කරන ලෙස අදාල සමාගම් වෙත උපදෙස් ලබා දි ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කර ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත ඇගයීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 156,572,000 ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තක්සේරු කළ ආකාරය සටහනක් මඟින් හෙළිදරව්කර නොතිබුණි. | තොගයේ වටිනාකම සහ තක්සේරු කල ආකාරය සටහනක් මඟින් 2019 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | තොග අගයකිරීමේ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කළයුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියට හිමිකාරීත්වය නොවුණු ඉඩම් දෙකක් රු. 466,325,000 කට අගය කර ගිණුම්ගත කර තිබුණි. තවද අධිකාරිය විසින් 1984-1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු. 64,320,853 ක් වූ ඉඩම් කට්ටි 02 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් 2 කම රජය සතු ඉඩම් වේ. අධිකාරියට අයත් නොමැති බැවින් 2019 වර්ෂයේදී පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | අධිකාරියට අයත් වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ අරලගංවිල බීජ ගොවිපලේ අවසන් තොගය වැඩියෙන් දැක්වීම 2017 වර්ෂයේදී නිවැරදිකර තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේදී නැවත එම වැඩියෙන් දැක්වීම ගිණුම්වල ගැලපීම නිසා සමාලොචිත වර්ෂයේ ලාභය රු. 5,286,227 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |
| (ඇ) | ජනපදිකයින් වෙත ණයදීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී බැංකු වෙත ලබා දී තිබුණු රු. 147,750,000 ක මුදලින් ණය ලබා දී ඇති ප්‍රමාණය ණයගැති ශේෂයක් ලෙසත් ඉතිරිය බැංකු මුදල් ශේෂයක් ලෙසත් ගිණුම්ගත කර නොතිබුණි. එම අරමුදලින් දුන් ණය ප්‍රමාණය, අයකල ණය ප්‍රමාණය සහ උපයන ලද පොළී ආදායම් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම්ද සටහනක් මඟින් දක්වා නොතිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කරමි. | භාණ්ඩාගාර ප්‍රදාන වලට අදාල විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත පවරා තිබුණු පිරිවැය රු.671,503,748 ක් වූ ස්ථාවර වත්කම්වලින් කොටසක රු.201,640,037 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණද, ඉතිරි වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. තවද එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ පහසුකම් යටතේ විවිධ කොන්ත්‍රාත්වලින් අධිකාරියට ලැබී තිබුණු රු.4,369,384 වත්කම්ද ගිණුම්ගත කර නොතිබුණි. | ශ්‍රී ලංකා වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් ලද සියලු වත්කම් තක්සේරු කර වටිනාකම් ලද වහාම අදාල ගිණුම්වලට ගැලපීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව එක් පංතියකට අයත් සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගතකිරීමටත් අදාල වත්කම්වල විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සී කලාපයේ ලැබිය යුතු හිඟ බදු මුදල ගණනය කර ගැලපීම් කර නොතිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලැබියයුතු හිඟ බදු මුදල ගණනය කර ගිණුම්ගත කළයුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අධිකාරියට රු. මිලියන 2,188 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබුණද එම ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සකස්කර ගෙන නොතිබීම හේතුවෙන් විලම්භිත ආදායම ක්‍රමානුකූලව ආදායමට හඳුනාගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමුච්චිත අරමුදල වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 24,647 ක් වී තිබුණි. | රාජ්‍ය ප්‍රදාන ගිණුම් ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල වන පරිදි රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමට නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කර ඒ අනුව රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (උ) | 2009 සහ 2010 වර්ෂවල රු. 500,000 බැගින් රු 1,000,000 ක් සත්දින තැන්පතු දෙකක පිළිවෙලින් සියයට 3 ක හා සියයට 10.5 ක වාර්ෂික පොළී අනුපාතයකට ආයෝජනය කර තිබුණි. එහි පොළී ආදායම ආයෝජනය කල දින සිට 2018 වර්ෂය දක්වාම ගිණුම්ගත කර නොතිබුණි. | සත්දින තැන්පතු සඳහා අදාල පොලිය එම තැන්පතු ඉවත් කර ගන්නා අවස්ථාවේදී පමණක් ගෙවීම් කරන බව බැංකුව දන්වා ඇත. | ආයෝජනයන් නිවැරදි හා නිශ්චිත අරමුණකින් සිදුකල යුතු අතර ඒවා පිලිබඳ පසු විපරම් සිදුකර වැඩි ඵලදායිතාවයක් ලබාගත හැකි පරිදි ආයෝජනය සිදුකල යුතුය. |
| (ඌ) | 2016 වර්ෂයේදී ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රු.20,960,226 ක් හිඟ බදු ආදායම, වර්ෂයේ ආදායමට ගෙන තිබීමේ වරද නිවැරදි කිරීමේදී සමුච්චිත අලාභ ගිණුමට හර කර ලැබියයුතු බදුකුලී ගිණුම බැරකළ යුතු වුවද ඉකුත් | 2019 වර්ෂයේ සිට අදාල බදු මුදල් නිවැරදිව හඳුනාගෙන ඒ අනුව ගිණුම් ගත කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අලාභ ගිණුම බැර කර ලැබියයුතු බදුකුලී ගිණුම හර කිරීම නිසා වර්ෂ අවසානයේ සමුච්චිත අලාභය රු.83,840,904 න් අඩු වී ලැබියයුතු බදුකුලී ගිණුම එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | | |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී සුළු පරිමාණ ජල විදුලි බලාගාරවලින් ලැබිය යුතු රු.5,373,634 ක රාජ්‍යභාග ගිණුම්ගත කර නොතිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කරමි. | ආදායම් හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව ලැබිය යුතු රාජ්‍ය භාග ගිණුම්ගත කළයුතුය. |
| (ඒ) | පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම්වලින් ජනිත වන ප්‍රාග්ධන ස්වභාවයේ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල සිදුකර තිබුණු පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම රු. මිලියන 2,182 ක් විය. | 2019 වර්ෂයේදී සිදු කරන බව දන්වා ඇත. | ප්‍රාග්ධන වියදම් මඟින් ජනිත වන ප්‍රාග්ධන වත්කම් හඳුනාගැනීමට සහ ගිණුම්ගත කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදිය යුතුය. |
| (ඔ) | අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන කලාප 10 ක රජයේ ඉඩම් හෙක්ටයාර් 637,810 ක්, ජලාශ 12 ක්, ඇලමාර්ග කි.මී 8,708 ක්, වැව් 463 ක්, පාරවල් කි.මී 1,127.5 ක් සහ විවිධ ජල සම්පාදන මූලාශ්‍ර 1,046 ක් නඩත්තු සහ නවීකරණ කටයුතු සිදුකරන අතර එම වත්කම් අධිකාරියේ පාලනයට හිමිකර දී තිබුණි. එසේ වුවත් එම වත්කම්වල විස්තර සටහනක් මඟින් හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 2019 වර්ෂයේදී සිදු කරන බව දන්වා ඇත. | මෙම වත්කම් අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ වී ඇති බැවින් හා එම වත්කම්වල පාලන අයිතිය අධිකාරියට පවරා ඇති බැවින්, එම වත්කම් පිළිබඳ තක්සේරුවක් සිදුකර මූල්‍ය ප්‍රකාශනවලින් පෙන්නුම්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.එසේම මෙම වත්කම් පරිහරණයට සහභාගීවන අනෙකුත් පාර්ශව සමඟ මේ පිළිබඳ සාකච්ඡා කර නිරවුල් ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට කටයුතු කල යුතුය. |
| (ඕ) | උඩවලව කලාපයට අයත් නිවාස 03 ක්, නිවාඩු නිකේතනයක් හා ගොඩනැගිල්ලක පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2019 වර්ෂයේදි ගිණුම්ගත කරමි. | අධිකාරියට අයත් වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | නිරාවිය ගොවිපල වෙත මොරගහකන්ද ව්‍යාපෘතියෙන් හා ගංගාද්‍රෝණි කාර්යාලයෙන් 2010 – 2016 කාලය තුළ ලබා දී තිබුණු යතුරු පැදි 12 ක්, මල්ටි වොපර් යන්ත්‍ර 02 ක්, කිරි ප්‍රවාහන ලොරියක්, ට්‍රැක්ටර් 03 ක්, කුකුළු පාලන ගොඩනැගිලි 04 ක්, විද්‍යුත් බර මැනුම් උපකරණ 02 ක් හා බෙලින් මැෂින් 01 ක් යන වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | යතුරු පැදි 3 ක් හා කිරි ප්‍රවාහන ලොරිය අධිකාරියට පවරාගෙන ඇත. 2019 වර්ෂයේ ඉතිරි වත්කම් පවරාගෙන ගිණුම් ගත කරමි. | අධිකාරියට අයත් වත්කම් හදුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

## 1.5.3 නොසැසඳුන පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| මහවැලි පශු සම්පත් සමාගමේ ආයෝජන වටිනාකම | 418,871,000 | 416,176,219 | 2,694,781 | වෙනසට හේතු හදුනාගෙන ඇත. 2019 වර්ෂයේදී නිවැරදි කරමි. | වෙනස්කම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

## 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විෂයය | මුදල | අවිනිශ්චිතව තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම | 14,117,550 | අවු 05 | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවිනිශ්චිත ගිණුම 2019 වර්ෂයේදී නිවැරදි කරමි. | හඳුනා නොගත් ගිණුම් නිරවුල් කිරීමට පියවර ගතයුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. | | | |
| (අ) | අයෝජන | 20,477,000 | කොටස් සහතික | ශේෂය සනාථ කිරීමේ ලිපියක් එම සමාගමේ ලේකම්වරුන්ගෙන් ලබාගෙන මේ සමඟ ඉදිරිපත් කරමි. | අදාල ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළයුතුය. |
| (ආ) | ඉතිරි කිරීමේ ගිණුම | 2,632,908 | ශේෂ සනාථන සහ පාස්පොත | සොයාබලා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | -එම- |
| (ඇ) | ස්ථාවර තැන්පතු | 727,481 | තැන්පත් සහතික ශේෂ සනාථන | -එම- | -එම- |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාවත්ත පරිශ්‍රයේ පිහිටි බාහිර පාර්ශවයන් විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි 13 ක් සඳහා තක්සේරු වාර්තා අනුව අයකර ගතයුතු කුළිය අයකර ගන්නා ලෙස දන්වා තිබුණද, රු.35,112,000 ක් 2019 වර්ෂයේ සැප්තැම්බර් දක්වා අයකරගෙන නොතිබුණි. අධිකාරිය විසින් එම ගොඩනැගිලි වෙනුවෙන් විදුලි හා ජල බිල්පත් ලෙස ගෙවා තිබුණු රු. 10,616,946 ක් අදාල පාර්ශව වෙතින් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. | විදුලි හා ජල බිල්පත් ලෙස ගෙවා තිබුණ මුදලින් රු.1,815,490 ක් ප්‍රතිපූරණය කරගෙන ඇති අතර ඉතිරි රු.8,801,455 ක් ප්‍රතිපූරණය කර ගැනිමට අදාල ආයතන වෙත දැනුම් දි ඇත. | අයකර ගතයුතු කුලී අයකර ගැනීමට හා දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 896,499,000 ක ලැබිය යුතු බදු කුලී ආදායමක් වූ අතර, ඉන් රු.428,065,000 ක් වර්ෂ 05 ක්ද, රු.157,225,000 ක් වර්ෂ 03 සිට 05 දක්වා කාලයක්ද ඉක්මවා තිබුණි. බදු ආදායම් රැස්කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක නොකිරීම හිහ බදු ආදායම් වාර්ෂිකව වැඩිවීමට හේතු වී තිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කරමි. | බදු ආදායම් රැස් කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ප්‍රකාරව නිසියාකාරව බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.454,398,000 ක වැඩපූර්ව අත්තිකාරම් වූ අතර, ඉන් රු.3,467,000 ක් වර්ෂ 05 ඉක්මවා තිබුණද, අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර වැඩපූර්ව අත්තිකාරම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

---------------------

| විගණන නිරීක්ෂණ | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු. 651,986,000 ක් වූ අතර, ඉන් රු. 46,443,000 ක් වසර 05 ඉක්මවා තිබුණි. එම ශේෂවල ඇතුළත් රු. 7,747,000 ක රඳවුම් මුදල්වලට අදාල කොන්ත්‍රාත් වැඩවල සම්පූර්ණත්වය තහවුරු කරගෙන රඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවුරුදු 05 ඉක්ම වූ රඳවුම් මුදල් 7,747,000 ක් කොන්ත්‍රාත්කරුවන් විසින් මෙතෙක් ඉල්ලුම් කර නැති අතර ආදායමට ගැනීමට කටයුතු කරමි. | රඳවුම් මුදල් නිදහස් කිරීමට හෝ තවදුරටත් වගකීමක් නොමැති ශේෂයන් හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇති රු. 780,070 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හා රු. 460,701 ක ශේෂ වසර 05 කට වැඩි කාලයක් තිස්සේ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 නිවැරදි කරමි. | දිගුකාලයක් තිස්සේ නිරවුල් නොවනු ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ තවදුරටත් වගකීමක් නොමැති ශේෂ හඳුනාගෙන ආදායමට බැර කිරීමට කටයුතු කළයුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2013 අංක 17 දරන එකතු කල අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය | මාස 12 කාලසීමාවකදී භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රු.මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතුය. නමුත් අධිකාරිය ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 93 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 152 ක් | එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි කිරීමට ඉදිරියේදී කටයුතු සිදු කරමි. | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රැස්කර තිබුණද එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 05 ක් ප්‍රමාදව 2019 ජූලි 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඒ සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | පරිගණක ගත ගිණුම් පද්ධතියක් ක්‍රියාත්මක නොවීම හා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට සිදුවීම හේතුවෙන් ගිණුම් ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව චක්‍රලේඛ නියමයන්ට අනුව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.3.3 ඡේදය | නිලධාරියෙක් ව්‍යාපෘතියකට නිදහස් කළ හැක්කේ රජයේ අවශ්‍යතාවය මත පූර්ණකාලීන පදනමින් අවුරුදු 05 ක් හෝ වැටුප් රහිත පදනම මත සේවකයාගේ ඉල්ලීම අනුව අවුරුදු 05 ක් සඳහා පමණි. නමුත් නිළධාරීන් 03 දෙනෙකු වසර 10 කටත් අධික කාලයක් තිස්සේ වෙළි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ සේවය සඳහා නිදහස්කර තිබුණි. | චක්‍රලේඛයට අනුගතව ඉදිරියේදී කටයුතු කරන අතර අවසන් අදියරේ පවතින ව්‍යාපෘතිවලට අනුයුක්ත සේවකයන් එම ව්‍යාපෘති අවසන් වූ පසු නිදහස් කිරීමටත් වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කරන ව්‍යාපෘතියට අනුයුක්ත සේවකයන් අත්දැකීම් බහුලත්වය මත ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ සේවය සඳහා යොදවා ගැනීමට අනුමැතිය ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | ව්‍යාපෘති සඳහා සේවකයන් නිදහස් කිරීමේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඇ) | අධිකාරියේ මූල්‍ය කාර්යපරිපාටි සංග්‍රහයේ 1.5.1 ඡේදය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ 02/2012 හා 2012 මාර්තු 15 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 05 වගන්තිය | අත්තිකාරම් මුදල ලබාගත් කාර්යය අවසන් වී දින 7 ක් ඇතුලත පියවියයුතු වුවද කලාප 10 ක හා අංශ දෙකකට අදාල වර්ෂ එකකට වඩා වැඩි නොපියවූ රු.175,963,000 ක සැපයුම් අත්තිකාරම් වි | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කිරිමට අදාල නිලධාරින්ට උපදේස ලබා දි ඇත. | අත්තිකාරම් මුදල ලබාගත් කාර්යය අවසන් වූ වහාම පියවීමට කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) සහ (ඇ) වගන්තිය | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුය. ඊළග එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කරනු ලැබිය යුතු වුවත් අධිකාරිය එසේ සිදුකර නොතිබුණි. ඉදිරි වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම එම වර්ෂය ආරම්භවීමට ප්‍රථම සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කිරිමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දි ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ට ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඊ) | ප්‍රසම්පාදන අත්පොතේ මාර්ගෝපදේශ 4.1 (ඇ) | මුල් ප්‍රසම්පාදන සැලැස්ම නිරන්තරයෙන් නියාමනය සහ යාවත්කාලීන කළයුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම එලෙස යාවත්කාලීන කර නොතිබුණු අතර ක්‍රියකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් සමඟ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කාර්යයන්වල වෙනස්කම් පැවතුණි. | -එම- | -එම- |

**02. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 423,600,000 ක අලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු. 437,478,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,878,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 අනාර්ථික ගනුදෙනු**

----------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 වර්ෂයේදී ණය ලබාදීමට චක්‍රීය අරමුදලක් ඇති කිරීමට රු.මිලියන 48 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණද ණය ලබාදීමට 2019 වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි මුදල් ආපසු ලබා දෙන ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට දැනුම් දී ඇත. ඊට අදාල පොලිය | දීර්ඝකාලයක් බැංකුවේ රඳවා තිබූ මුදල් ආපසු ලබාගෙන ආර්ථික |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු වටිනාකම රු මිලියන 88.2 ක් වූ අතර සාමාන්‍ය ඉතුරුම් පොලියටත් වඩා අඩු සියයට 4 ක පොලියක් යටතේ මෙම අරමුදල් දීර්ඝකාලයක් බැංකුවේ රඳවා තැබීම අනාර්ථික කටයුත්තක් වී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලබා දිම පිනිස එම බැංකුවේ "වත්කම් හා වගකිම් කළමණාකරණ කමිටුව" වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව බැංකුව විසින් දැනුම් දි ඇත. | වශයෙන් ඵලදායී කටයුත්තක් සඳහා යොදවා ගැනීමට කටයුතු කළයුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| විගණන නිරීක්ෂණ | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ රු. 8,550,788 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලය සතු දොඹකර යන්ත්‍රයක් නිසි පරිදි අළුත්වැඩියා කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 29 දින සිට 2019 මැයි දක්වා නිශ්කාර්යව පැවතුණි. | 2014 හා 2015 වර්ෂවල ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අලුත්වැඩියාව සිදුකල නොහැකි වූ අතර 2016 නැවත ඇස්තමේන්තුවක් ලබාගෙන 2017 දෙසැම්බර් 29 ගෙන්වන ලද එන්ජිම සවිකර ක්‍රියාත්මක කර තිබුණි. එහිදී දෝෂ වාර්තා නොවූ අතර දොඹකරයේ BOOM එක ක්‍රියාත්මක කිරීමට යාමේදී ප්‍රධාන නල 2 ක් පුපුරා තිබුණි. එහිදී පද්ධතියේ සියලුම අමතර කොටස් සවිකිරීම කල යුතු විය. ඒ අනුව ඒජන්තවරුන්ගෙන් 2018 වර්ෂයේදී ඇස්තමේන්තුවක් ලබා ගත් අතර ඊට අනුමැතිය ලැබුණද මුදල් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අලුත්වැඩියාව සිදුකල නොහැකි විය. 2019 වර්ෂයේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. | නිසි පරිදි අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලයේ පැරණි චේලි ආදර්ශනය ඉවත්කර තිබුණු අතර නව චේලි ආදර්ශනයක් සැකසීම සහ පවතින නැරඹුම් මැදිරිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 වර්ෂයේ රු.6,990,000 කට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණද රු.2,060,000 ක් වැය කර ඉදිකිරීමට සැලසුම් කර තිබුණු චේලි ආදාර්ශනය 2019 මැයි වන විටත් අවසන් කර නොතිබුණි. | ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් අදාල කටයුත්ත සිදුකල නොහැකි විය. | කොන්ත්‍රාත්තුව අදාල කාලසීමාව තුළ නිමකිරීමට පියවර ගතයුතුය. |
| (ඇ) | සූරියවැව කොට්ඨාශ කළමනාකරණ බලප්‍රදේශයේ පිහිටි අංක 6758 දරන ඉඩමේ බලපත්‍රලාභියා බදු මුදල් නොගෙවීම මත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 107 සිට 112 දක්වා | බදු කරුවන් වෙත හිඟ බදු මුදල් නොගෙවීමේ හේතුව මත නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | ඉඩම් සංවර්ධන ආඥා පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළයුතු අතර හිගබදු මුදල් අයකර |

| | | | |
|---|---|---|---|
| | වගන්ති ප්‍රකාරව අවසර පත්‍රය විධිමත්ව අවලංගු නොකර නැවත පුද්ගලයන් දෙදෙනෙකුට ලබා දී තිබුණි. ඉන් එක් අයෙකු 2013 වර්ෂයේ සිට දළ තක්සේරුව මත බදු ගෙවා තිබුණද අනෙක් පුද්ගලයාගෙන් රු.53,600 ක් අයවිය යුතුව පැවතුණි. | | ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | අංක 6438 දරන ඉඩමට සූරියවැව කොට්ඨාශ කළමනාකරු ලබා දී තිබුණු අවසර පත්‍රය වලව නේවාසික ව්‍යාපාර කළමනාකාර විසින් එය ව්‍යාජ අවසර පත්‍රයක් බව දක්වා තිබුණි. මෙම ඉඩමෙන් පර්චස් 80 ක් අනවසර ඉඩම් නියමානුකූල කිරීම යටතේ වෙනත් අයෙකු වෙත ලබා දී තිබුණද ලබාගත් දින සිට බදු ගෙවා නොතිබුණු අතර දළ තක්සේරුව මත අයවිය යුතු හිඟ බදු මුදල රු.111,680 ක් විය. බදු ගෙවා නොතිබුණද ඉඩම අවලංගු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ඉඩම සම්බන්ධයෙන් පාර්ශව දෙකක් අතර කලක පටන් ආරවුලක් පවතින අතර ඒ හේතුව මත බදු අය කර ගැනිමට නොහැකි වී ඇත. නිතිමය පියවර ගැනිමට කටයුතු කරන ලෙස නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය) වෙත දැනුම් දි ඇත. | හිඟ බදු මුදල් අයකර ගැනීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | සූරියවැව කොට්ඨාශ කළමනාකරණ බලප්‍රදේශයේ පිහිටි අංක 6407 දරන ඉඩම පුද්ගලයෙකු විසින් අනවසරයෙන් භුක්ති විදින අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2019 වර්ෂය දක්වා අධිකාරිය කටයුතු කර නොතිබුණි. | නිතිමය පියවර ගැනිමට කටයුතු කරන ලෙස නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය) වෙත දැනුම් දි ඇත. | අනවසරයෙන් භුක්ති විදින ඉඩම් නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඊ) | සී කලාපයේ කෘෂිකාර්මික කළමනාකරණ මධ්‍යස්ථානයේ ආදායම මාසිකව ප්‍රධාන කාර්යාලට ප්‍රේෂණය කර නොතිබුණු අතර බැංකු ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට රු. 87,856,695 ක් පැවතුණි. එම මුදල් ආයෝජනය කිරීමක් හෝ සිදු නොකර නිශ්ක්‍රීයව පැවතුණි. | මෙම මුදල් අදායම් ලෙස ප්‍රධාන කාර්යාලයේ ආදායම් ගිණුමට බැර කිරිමට උපදෙස් දෙන ලදි. | මුදල් ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළයුතුය |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් රු.1,193,155,190 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද සත්‍ය වශයෙන් උපයා තිබුණේ ඉන් සියයට 63 ක් වූ රු.753,493,183 ක් පමණි. ඉන් එච්, උඩවලව සහ සී කලාපවල ඇස්තමේන්තුගත ආදායමින් ආදායම් ඉපයීමේ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු විය. | අධිකාරියේ අදායම් ඉපයිම් ඉහළ නංවා ගැනිම සම්බන්ධව ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදි මෙන්ම ලිඛිතවද අදාල නිළධාරීන් වෙත ඉලක්ක ලබා දි ඒ පිලිබදව ප්‍රගතිය නිරන්තරව සමාලෝචනය කිරිමට කටයුතු කර ඇත. | ඇස්තමේන්තු කල ආදායම උපයා ගැනීමට කටයුතු කළයුතු අතර ආදායම් උපයාගැනීමේ ඉලක්ක කරා ළගාවීමට නොහැකිවූ හේතු විශ්ලේෂණය කර ඒ සඳහා නිවැරදිකිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී සුළු පරිමාණ ජල විදුලිබලාගාරවලින් මහවැලි අධිකාරිය රු. මිලියන 330 ක ආදායමක් ඉපයීමට ඇස්තමේන්තු කර තිබුණද ඉන් සියයට 60 ක් උපයා තිබුණි. පූර්ව විගණන විමසුම් මගින් නිරීක්ෂණය කළ ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ පිහිටි 70 ක් වන සුළු පරිමාණ ජලවිදුලි | ඉන්වොයිස්පත් ලංකා විදුලි බල මණ්ඩලය වෙත යොමුකර ඇත.<br>විදුලි උත්පාදන වෙනුවෙන් අයවිය යුතු මුදල් ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් මෙවනතෙක් අධිකාරිය වෙත ලැබි නොමැති අතර මහා භාණ්ඩාගාරයේ මැදිහත්විම | ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | බලාගාර කිසිවක් සහ මොරගහකන්ද බලාගාර තුන ආදායම් ඇස්තමේන්තු සඳහා යොදාගෙන නොතිබුණු අතර විගණිත දිනය දක්වා එම බලාගාරවලින් කිසිදු ආදායමක් ඉපයීමට මහවැලි අධිකාරිය අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා කාලය තුල මොරගහකන්ද සුළු පරිමාණ ජලවිදුලි බලාගාර තුන මඟින් උත්පාදනය කළ කි.වොට් 28,566,405 ක විදුලිබලය සඳහා රු.මිලියන 496.8 ක මුදලක් විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු වුවත් විගණිත දිනය දක්වා එම මුදල් අයකරගෙන නොතිබුණි. 2018 වර්ෂයට අයවිය යුතු මුදල්ද ඇතුළුව 2019 වර්ෂයේ මැයි වන විට අයවිය යුතු සමස්ත මුදල රු.මිලියන 964.1 ක් වී තිබුණි. | ලබාගෙන එම මුදල් ලබා ගැනිමට කටයුතු කරමින් පවති. | |
| (එ) | මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය (බී කලාපය) සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් මුදල් වෙන්කරගෙන තිබුණද එහි කටයුතු සිදුකල බවට තොරතුරු නොවුණි. එම මුදල් උපයෝජනය කර 2014 වර්ෂයේ සිට රු.මිලියන 935 ක ඇස්තමේන්තුවකට මාදුරු ඔය වම් ඉවුර (බී කලාපයේ) සිංහපුර කොට්ඨාශයේ මහවැලිතැන්න සහ මල්වැන්න ඒකකවල නැවත පදිංචිකිරීමේ ව්‍යාපෘතිය සිදුකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී නොතිබුණි. ව්‍යාපෘති කාලය 2016 වර්ෂයෙන් අවසන් වී තිබුණද කාලය දීර්ඝකරගෙන නොතිබුණු අතර 2018 වර්ෂයේදී 2019 දක්වා කාලය දීර්ඝකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගෙන් ඉල්ලීමක් සිදු කර තිබුණි. 2018 වර්ෂයේදී මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය නැවත දේශීය සහ චීන විදේශ අරමුදල් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු. 5,145,000 ක් වෙන්කරවාගෙන තිබුණි. | බී කලාපයේ, මාදුරු ඔය වම් ඉවුර මල්වැන්න හා මහවැලිතැන්න ඒකකයන් අයත් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා 2013 වර්ෂයේදී ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉල්ලුම් කල අතර ඊට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී එය මාදුරු ඔය දකුණ ඉවුර ව්‍යාපෘතියේ උප අංශයක් ලෙස ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දෙනු ලැබීය. | අනුමැතිය ලබා දී ඇති ව්‍යාපෘතිය සඳහාම ප්‍රතිපාදන වැය කල යුතුය. |
| (ඒ) | වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය සඳහා රු.මිලියන 3,957 ඇස්තමේන්තුවකට අනුමත වී තිබුණු අතර ව්‍යාපෘති කාලය අවසන් වී තිබුණද එහි කාලය දීර්ඝ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ අනුමැතීන් ලද බවට සාක්ෂි නොවුණි. 2021 දක්වා කාලය දීර්ඝකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගෙන් ඉල්ලීමක් පමණක් සිදු කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමුච්චිත වියදම රු.මිලියන 2018.2 ක් සහ භෞතික ප්‍රගතිය | ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට ඉල්ලීම් කර ඇති අතර 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදනද අනුමත වී ඇත. ව්‍යාපෘතියේ ප්‍රගතිය අමාත්‍යාංශයට හා අනෙකුත් ආයතන වලට වාර්තා ඉදිරිපත් කර ඇත.<br>රුපියල් මිලියන 12.8 ක ප්‍රතිපාදන වෙන්කරන ලද්දේ කිවුල් ඔය ජලාශයේ කටයුතු වලට නොවන අතර එල් කලාපයේ පිහිටා ඇති "වැලි ඇලෙහි" සංවර්ධන කටයුතු | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීමටත්, ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ප්‍රගති වාර්තා සකස් කිරීමටත් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | සියයට 66 ක අවමයක විය. මෙම ව්‍යාපෘතියේ අරමුණු වූ යුද්ධය නිසා අවතැන් වූ ඉඩම් අහිමි පවුල් 6,963 ක් නැවත පදිංචිකිරීම, හෙක්ටයාර් 6,258 ක ඉඩම් සංවර්ධනය කිරීම සහ කි. මී. 150 ක පාරවල් හා කි. මී. 132 අතු මාර්ග සංවර්ධනය කිරීමේ ප්‍රගතිය පරීක්ෂාකිරීමට හැකි පරිදි ව්‍යාපෘති ප්‍රගති වාර්තා හෝ කාර්යසාධන වාර්තා සකස් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන අනුව රු. 12,800,000 ක් භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන අනුමත කර නොතිබුණු කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි. | සඳහා වේ. එල් කලාපයේ ජල ගැටළුව සඳහා යෝජිත ව්‍යාපෘතියක් වන කිවුල් ඔය ජලාශයේ කටයුතු ආරම්භ කර නොමැත. නියෝජ්‍ය අධ්‍යක්ෂ (කිවුල් ඔය) විසින් පරිසර ඇගයීම් වාර්තාව නිරවුල් කර ගැනීම සඳහා වැඩ කටයුතු සිදු කරන අතරතුර කාර්ය මණ්ඩලය යොදවා ඉහත සංවර්ධන කටයුතු සිදු කෙරිණි. | |
| (ඔ) | වැලිකන්ද නේවාසික ව්‍යාපාර කළමනාකරණ බලප්‍රදේශයේ ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කර තිබුණු ඉඩම් අටකින් ඉඩම් හයක කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබුණි. ඒ අනුව ඉඩම් ලබාදීමෙන් අධිකාරිය අපේක්ෂා කල අරමුණු ඉටු වී නොතිබුණි. ඉඩම් බැහැරකිරීමේදී 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 199 (3) ඡේදය ප්‍රකාරව මහජන විරෝධතා සඳහා අවකාශ ලබාදෙමින් බදුදීමේ යෝජනාව ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කර නොතිබුණු අතර ඉඩම් බැහැර කිරීමට පෙර මහවැලි මූලික සැලසුම්වල යෝජිත ඉඩම් පිහිටි ස්ථානයන් හා ඉඩම් පරිහරණ රටාවන් පිළිබඳ අධ්‍යයනයක් සිදුකර එම ඉඩම් අපේක්ෂිත ආයෝජන කාර්යය සඳහා බැහැර කිරීම යෝග්‍යයද යන්න තීරණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. මෙම ඉඩම්වලින් ඉඩම් හතරක් මූලික සැලසුම්වල රිදීතැන්න සහ ජයන්තියාය ඒකකවල ජනපදිකයින්ගේ ජනාවාස වෙනුවෙන් ගොඩ ඉඩම් ලෙස වෙන්කර තිබුණද එම අරමුණට පටහැනිව ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කර තිබුණි. ඉඩම් කැබලි 3 ක් නියමිත පරිදි සංවර්ධනය නොකිරීම මත අවස්ථා කිහිපයකදී තේරීම්ලාභීත්වය නැවත සලකා බැලීමේ පරීක්ෂණ සිදුකර තිබුණද විගණිත දිනය දක්වා තේරීම්ලාභීත්වය විධිමත්ව අවලංගු කර නොතිබුණි. | විශේෂ හේතු මත ලබා දෙනු ලබන ඉඩම් සඳහා මහජන විරෝධතා සඳහා ගැසට් කිරීමකින් තොරව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කොටස් ලබා දීම සිදුකර ඇත. සංවර්ධනය නොකරන ලද ඉඩම් අවලංගු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මාර්ගය අසල ඉඩම්වල පදිංචි වී ඇත. | ඉඩම් ලබාදීමෙන් අධිකාරිය අපේක්ෂා කළ අරමුණු ලඟාකර ගැනීමට හැකිවන පරිදි චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඕ) | 2013 වර්ෂයේදී එවකට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා හිරා පදනම වෙත ලබා දී තිබුණු අක්කර 35 ක ඉඩම පසුව 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක් වූ | ශ්‍රී ලංකා හීරා පදනම විසින් 2013 වර්ෂයේදී වෘත්තීය පුහුණු ඉංජිනේරු විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීමට ඉල්ලීම් කල අතර ඊට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ව්‍යාපෘතිය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීමේ | නිසි අධිකාරී බලයක් රහිතව ඉඩම් බැහැර කිරීමට අනුමැතිය ලබාදීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට විරුද්ධව |

| | | | |
|---|---|---|---|
| | බැටිකලෝ කැම්පස් ( ප්‍රයිවට් ) ලිමිටඩ් වශයෙන් වෙනස් කර දීර්ඝකාලීන බදු ඔප්පුව එම සමාගමේ සභාපති නමින් නිකුත් කර තිබුණි. ලබා දී තිබුණු අක්කර 35 ට වඩා අනවසරයෙන් භුක්ති විඳින් බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වුවත් එම කොටස මේ දක්වා අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි. 2017 වර්ෂයේ තවත් අක්කර 45 ක් හිරා පදනම නමින් ඉල්ලා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් විෂයභාර අමාත්‍යවරයාගෙන් පූර්ව අනුමැතිය ඉල්ලා තිබුණි. අමාත්‍යවරයා විසින් සිය අත්සන පමණක් යොදා තිබුණු අතර ඒ අනුව එම අක්කර 45 ලබාදීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. | අවශ්‍යතාවය මත ව්‍යාපෘති නාමය බැටිකලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කිරීමට 2016 දී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2017 වර්ෂයේදී විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන ඇති අතර බදුකර හතරක් යටතේ ඉඩම් ලබා දීමට 2018 දී අනුමත කර ඇත. තවත් අක්කර 45 ක් ලබා දීමට අනුමැතිය ඉල්ලා ඇත. | විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර අනවසරයෙන් අත්පත් කරගෙන ඇති ඉඩම් නැවත අධිකාරිය වෙත පවරාගැනීමට කටයුතු කළ යුතුය. රජයේ ඉඩම් අවසතු කිරීම රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව හා රජයේ ඉඩම් ආඥා පනතට අනුකූලව සිදුකළ යුතුය. |
| (ක) | වැලිකන්ද කලාපය තුළ ඉඩම් ලබාදී ඇති ආයෝජන ව්‍යාපෘතිවලින් 2018 දෙසැම්බර් 31 දිනට රු. 31,114,866 ක මුදලක් අයවියයුතුව පැවතුණි. | බී කලාපය තුල ඉඩම් ලබා දී ඇති ව්‍යාපෘතිවලින් 2018 දෙසැම්බර් 31 දින වන විට රු. 31,114,866 ක මුදලක් හිඟ බදු ලෙස අයවීමට ඇත. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ග) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් භාවිතාකරන රත්මලාන, කල්දෙමුල්ල පිහිටි ඉඩම, ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් අයකර ගතයුතු රු. 9,450,000 ක බදු කුලිය අයකරගෙන නොතිබුණු අතර භාවිතා කරන විදුලිය සහ ජලය සඳහා ගාස්තු ගණනය කර අයකිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අතර සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශ කරන ලද පරිදි වාර්මාර්ග දෙපාර්තමේන්තුවට මේ වන විට අරමුදල් හා ප්‍රතිපාදන නොමැති බවත් කුලී මුදලෙන් 50% ක් ගෙවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි. | බදු කුලිය, විදුලිය හා ජල ගාස්තු අයකර ගැනීම සඳහා පියවර ගතයුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ හා මොරගහකන්ද ව්‍යාපෘතියේ අනුමත සැලැස්මේ ඇතුලත් නොවූ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට මොරගහකන්ද ජලාශයේ ආකෘතියක් ඉදිකිරීමට රු. 2,580,000 ක් වැයකර තිබුණි. ඊට අදාලව ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන ලබාදීමට අමාත්‍යාංශ ලේකම් විසින් දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණද එය සිදුකර නොතිබුණි. | මෙය විශේෂ කලාත්මක නිර්මාණශිලි කලාකෘති ඉදිකිරීමක් බැවින් දළ ඇස්තමේන්තුවක් පිලියෙල කිරීම ප්‍රායෝගිකව කල නොහැකි විය. ආයතන 06 කින් මිල ගණන් කැඳවූ අතර තාක්ෂණ ඇගයීම් කමිටුව අවම මිල ඉදිරිපත් කල ආයතනය තෝරා ගෙන ඇත. අධිකාරිය වියදම් දරා ඇති අතර ව්‍යාපෘතියෙන් එය ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලා ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ යේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදුකළයුතුය. |

මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ප්‍රතිපූරණය කරගැනීමට සැලසුම් කර තිබුණද දළ ඇස්තමේන්තුවක් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත්කර නොතිබීම නිසා ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූරණය කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (අ) ඡේදයට පටහැනිව හා අනුමත වැය ඇස්තමේන්තුවකින් තොරව 2018 ජූලි 10 දින ප්‍රසම්පාදන කමිටුව විසින් උක්ත ප්‍රසම්පාදන කටයුත්ත සඳහා අනුමැතිය ලබාදී තිබුණු අතර අධිකාරිය විසින් ගෙවීම් සිදුකර තිබුණි.

### 3.4 වෙනත් සංවිධානවලට මුදාහල සම්පත්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් ගිවිසුම් ගතවීමකින් තොරව බී කලාපයේ ගොඩනැගිලි 19 ක්, ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 11 ක්, වලව කලාපයේ ගොඩනැගිලි 07 ක් හා මූලික වැඩපාලන ක්‍රියාකාරවුම් හා නඩත්තු අංශයේ ගොඩනැගිලි 49 ක් බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණි. | ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 5 කට හිඟ කුලී ගෙවන ලෙස දැන්වීම, ගොඩනැගිලි 2 ක් දීර්ඝකාලීන බදුපදනමට දීමට අනුමැතිය ලබාදීම හා ගොඩනැගිලි 5 ක් නැවත තක්සේරු කිරීමට කටයුතු කර ඇත. පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.<br>බී කලාපයේ එක් නිල නිවාසයක් ඉවත් කිරීමටත් ගොඩනැගිලි 17 සඳහා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරමින් පවතී. | බාහිර පාර්ශව වෙත ඉඩම් හා ගොඩනැගිලි ලබාදීමේදී ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළයුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියට අයත් මහවැලි ආරක්ෂක බළකායේ සේවය කරන ලද සේවකයින් 44 දෙනෙකු 2015 වර්ෂයේ සිට විවිධ රාජ්‍ය ආයතන වෙත නිදහස් කර තිබුණු අතර, ඉන් 12 දෙනෙකු 2018 වර්ෂය තුළදී නැවත ආරක්ෂක බළකායේ සේවයට වාර්තා කර තිබුණි. උක්ත නිලධාරින්ට 2018 දෙසැම්බර් 31 දින වන විට ගෙවූ වැටුප් රු.66,141,532 ක්, හා අතිකාල හා ගමන් වියදම් රු.31,448,940 ක් අදාල ආයතනවලින් ප්‍රතිපූරණය කර ගැනීමට 2019 පෙබරවාරි 13 දින වනවිටත් අධිකාරිය අපොහොසත්වී තිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට මහවැලි ආරක්ෂක බලකායේ සේවය කරන ලද රාජය ආයතන වෙත නිදහස් කර ඇති නිලධාරින්ට ගෙවන ලද අතිකාල හා ගමන් වියදම් රු.31,448,940.00 ක මුදල ප්‍රතිපූර්ණ කරන ලෙස ලිපි මගින් දන්වා ඇත. | අදාල ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | අධිකාරියට අයත් ප්‍රධාන කාර්යාලයේ | වැටුප් ප්‍රතිපූර්ණය වි ඇති අතර රේඛිය | අදාල ගෙවීම් |

| | | |
|---|---|---|
| නිලධාරීන් 28 දෙනෙකුද, මොරගහකන්ද කලාපයේ එක් නිලධාරියෙකුද, බී කලාපයේ නිලධාරීන් 03 දෙනෙකුද හුරුළුවැව කලාපයේ එක් නිලධාරියෙකු ඇතුළුව නිලධාරීන් 33 දෙනෙකු රේඛීය අමාත්‍යාංශය හා වෙනත් බාහිර ආයතන වෙත නිදහස් කර තිබුණි. රේඛීය අමාත්‍යාංශයට හා බාහිර ආයතනවලට පිළිවෙලින් නිදහස් කරන ලද නිලධාරීන් 19 කු හා 14 කු වෙනුවෙන් ගෙවන ලද රු. 22,732,617 ක හා රු. 12,761,670 ක වැටුප්, අතිකාල හා ගමන් වියදම් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් ප්‍රතිපූරණය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය හා වෙනත් අමාත්‍යාංශ වෙත නිදහස් කර ඇති නිලධාරින්ගේ වැටුප් අතිකාල ගමන් වියදම් ලෙස දන්වා ඇත. | ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළයුතුය. |

**04.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

--------------------------------------------

**4.1** **තිරසර සංවර්ධන අරමුණු**

------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් කෙසේ ක්‍රියාත්මක කර තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල තොරතුරු අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) සතුව පවතී | තිරසර සංවර්ධනය පිළිබඳව න්‍යාය පත්‍රය ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගතයුතුය. |